www.agaram.lk

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test –April 2019

පළමුවාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time :2 hour**

## History – I

## ඉතිහාසය– I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.**

- **අංක 1-5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. පුරාණ කෘෂිකර්මාන්තයේ පැවති ප්‍රධාන කොටස් දෙක වනුයේ,
   (1) ගොවිතැන හා සත්ත්ව පාලනයයි
   (2) හේන් ගොවිතැන හා කුඹුරු ගොවිතැනයි
   (3) මඩ ගොවිතැන හා සත්ත්ව පාලනයයි
   (4) හේන් ගොවිතැන හා සත්ත්ව පාලනයයි

2. පිටබිම් යනුවෙන් අතීත හේන් වගාව හඳුන්වා ඇත්තේ,
   (1) සද්ධර්මාලංකාරයේ ය (1) උම්මග්ග ජාතකයේ ය
   (3) මහාවංසයේ ය (4) සෙල්ලිපිවල ය

3. මාගම සිට පැමිණි සුරනිමල යෝධයා අනුරාධපුරයේ පිහිටි වෙළෙඳසැළකින් මිළට ගත් බව සඳහන් වන වෙළෙඳ ද්‍රව්‍ය වනුයේ,
   (1) රෙදි පිළි (2) සුවඳ විලවුන්
   (3) වළං (4) ආභරණ

4. ශ්‍රී ලංකාවට අයත් තට්ටු හා පඩිපේළි වලින් යුක්ත නැව් හමුවී ඇත්තේ කුමන රටක වරායන්වලින් ද?
   (1) ඉන්දියාව (2) ජපානය
   (3) චීනය (4) පර්සියාව

5. මහාවංසයේ සඳහන් වන පරිදි තම ළමා කාලය දොරමඩලාව නම් ගමෙහි ගතකළ රජතුමා,
   (1) දුටුගැමුණු රජතුමා (2) 1 වන විජයබාහු රජතුමා
   (3) පණ්ඩුකාභය රජතුමා (4) 1 වන පරාක්‍රමබාහු රජතුමා



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

- **අංක 6-10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

6. ත්‍රිකුණාමලය වරාය අතීතයේ දී........................................ වරාය නමින් හැඳින්විය.
7. වරාය වලට පැමිණෙන නැව් වලින් බදු එකතු කිරීමට සිටි නිලධාරීන් ........................................නමින් හැඳින් වේ.
8. සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් මූලාශ්‍රවල හඳුන්වා ඇත්තේ........................................ යනුවෙනි.
9. අතීතයේ දී තඹ ආශ්‍රිත නිර්මාණ කළ ශිල්පීන්........................................යනුවෙන් හඳුන්වනු ලැබී ය.
10. රුවන්වැලි සෑය සැරසීමට භාතිකාභය රජු........................................ රටින් පබළු ගෙන්වීය.

- **අංක 11-15 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන තුළ යොදන්න.**

11. අත්තම් ක්‍රමය යනු ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීමේ ක්‍රමයයි. (     )
12. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ චණ්ඩාල කුලයේ අය සඳහා වෙනම සුසාන භූමි වෙන්කර තිබුණි. (     )
13. ආගමික ස්ථානයකින් ඉදිරියෙන් යන විට අවමඟුල් පෙරහැර වල මළබෙර වාදනය කරයි. (     )
14. තැම්බූ වී කොටාගත් විට කැකුළු සහල් සාදා ගත හැකි ය. (     )
15. නානාදේසී යනුවෙන් හඳුන්වා ඇත්තේ දේශීය වෙළෙඳුන් විසින් පිහිටුවා ගත් වෙළෙඳ සංවිධානයි. (     )

- **අංක 16-20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරෙහි ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.**

| | | | |
|---|---|---|---|
| 16. ලම්භකරණ පෙළපතට අයත් රජු | | a | සාලිය |
| 17. මෞර්ය වංශයට අයත් රජු | | b | දේවානම් පියතිස්ස |
| 18. ලංකාවට බුදු දහම හඳුන්වා දීමට මුල් වූ රජු | | c | වසභ |
| 19. අශෝකමාලා සමඟ විවාහ වූ කුමරු | | d | iii වන අග්ගබෝධි |
| 20. දිවා රාත්‍රී තම මවට උපස්ථාන කිරීමෙන් සතුටට පත් වූ රජු | | e | ධාතුසේන |

(ලකුණු 20 x 2 =40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test – April 2019

පළමුවාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

## History – II

ඉතිහාසය– II

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **I වන ප්‍රශ්නය අනිවාර්ය වේ. අනෙක් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

❖ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

1. A




(i) මෙම රූපයෙන් දැක්වෙන උපකරණය හැඳින්වෙන නම ලියන්න.

(ii) මෙය භාවිතා කරන්නේ කුමන කර්මාන්තයකදී ද?

(iii) මෙම කර්මාන්තයේ නියුතු වූවන් හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iv) මෙය යොදා ගෙන සැදූ භාණ්ඩයක නම ලියන්න.

B




(i) මෙම රූපයෙන් දැක්වෙන උපකරණය හැඳින්වූ නම ලියන්න.

(ii) මෙම උපකරණය භාවිතා කරන්නේ කුමන කර්මාන්තයකදී ද?

(iii) මෙම කර්මාන්තයේ නියුතු වූවන් හඳුන්වන්නේ කුමන නමින් ද?

(iv) මෙම උපකරණය භාවිතයෙන් සැදූ භාණ්ඩයක නම ලියන්න.

C



(i) මෙම රූපයෙන් දැක්වෙන කාසිය හැඳින්වූ නම කුමක් ද?

(ii) මෙය හමු වූ ස්ථානය නම් කරන්න.

(iii) මෙහි ඇතුලත් සංකේතයක් ලියන්න.

(iv) මෙය සාදා ඇති ලෝහ වර්ගය නම් කරන්න.

(ලකුණු 1 x 12=12)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

2. (i) ඇල් වී යනු මොනවා ද? (ල.03)
   (ii) a- ඇල් හේන් යනු මොනවා ද? (ල.01)
   b- අතීතයේ දී වගා කළ ඇල් වී වර්ග 3ක් නම් කරන්න. (ල.03)
   (ii) a- හේනක් ආරක්ෂා කර ගැනීමට අතීත ගොවීහු අනුගමනය කළ ක්‍රම 3ක් ලියන්න. (ල.03)
   b- ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න. (ල.02)

3. (i) තෝනිගල සෙල්ලිපියේ සඳහන් වී වගා කළ කන්න 3 නම් කරන්න. (ල.03)
   (ii) මඩගොවිතැනේ දී භාවිතා කළ පහත වචනවල අර්ථය ලියන්න.
   a- ගොයම් කොළ
   b- කමත (ල.04)
   (ii) a- අතීතයේ දී සත්ත්ව පාලනය යටතේ ඇතිකරන ලද ගවයන්ගෙන් ලබාගන්නා ලද ප්‍රයෝජන 3ක් ලියන්න. (ල.03)
   b- ඉන් එකක් විස්තර කරන්න. (ල.02)

4. (i) අභ්‍යන්තර වෙළෙඳාමේ දී හුවමාරු වූ භාණ්ඩ වර්ග 3ක් ලියන්න. (ල.03)
   (ii) බදුලු ටැම් ලිපියෙහි ඇතුළත් වෙළෙඳසැළක පාලනය සම්බන්ධ නීති 4ක් ලියන්න. (ල.04)
   (iii) a- අතීතයේ දී වෙළඳම දියුණු වීමත් සමඟ බිහි වූ වෙළෙඳ නගර 2ක් නම් කරන්න. (ල.02)
   b- පහත වචනවලින් හඳුන්වන්නේ කුමක්දැයි ලියා දක්වන්න.
   1. නිගම 2. පූග 3. පටුන්ගම (ල.03)

5. (i) රටක සංස්කෘතිය යනු කුමක් ද? (ල.03)
   (ii) ලංකාවට බුදුදහම හඳුන්වා දීමත් සමඟ සමාජය තුළ ඇති වූ වෙනස්කම් 4ක් ලියන්න. (ල.04)
   (iii) a- අතීත සමාජයේ ජීවත්වූවන් තුළ පැවති යහපත් සිරිත් තුනක් ලියන්න. (ල.03)
   b- ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

6. (i) විදේශය වෙළෙඳාමේ දී අපනයනය කළ භාණ්ඩ වර්ග හයක් ලියන්න. (ල.03)
   (ii) අතීතයේදී ලංකාව සමඟ විදේශ වෙළෙඳාමේ යෙදුනු රටවල් 4ක් හා ආනයනය කළ භාණ්ඩ වර්ග 4ක් ලියන්න. (ල.04)
   (iii) a- අතීතයේදී ලංකාවේ තිබූ වරායන් 3ක් නම් කරන්න. (ල.02)
   b- අතීතයේ දී ශ්‍රී ලංකාවේ දියුණු විදේශ වෙළෙඳාමක් තිබූ බවට ඇති සාක්ෂි දෙකක් ලියන්න. (ල.03)

7. (i) මානවම්ම රජපෙළපතට අයත් රජවරු තිදෙනෙකු නම් කරන්න. (ල.03)
   (ii) මානවම්ම රජ පෙළපත බලයට පත්වීමට පෙර මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු ලක්ෂණ 2ක් ලියන්න. (ල.04)
   (iii) ''අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව කටයුතු කිරීමෙන් තම අරමුණු ජයගත හැකි ය. මනවම්ම රජුගේ චරිතය ඇසුරින් කෙටියෙන් පැහැදිළි කරන්න. (ල.05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

මුළු ලකුණු

20x2 =40
12 x 4=48
12 x =12
100

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk